**මධ්‍යම පළාත් සභාව - 2016**

**-----------------------------**

මධ්‍යම පළාත් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

2.2.1 පළාත් සභා අරමුදල

----------------------

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

2.2.2 අනෙකුත් ගිණුම්

------------------

විසර්ජන ගිණුම් ඇතුළු අනෙකුත් ගිණුම්

------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව 2017 මාර්තු 31 දිනට ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| ගිණුමේ නම | 2016 වර්ෂයට අදාළ | |
|---|---|---|
| | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව |
| (i). විසර්ජන ගිණුම් | 34 | 34 |
| (ii). පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 66 | 66 |
| (iii). පළාත් සභා මන්ත්‍රීවරුන්ට ණය පහසුකම් අත්තිකාරම් ගිණුම | 01 | 01 |
| (iv). වාණිජ අත්තිකාරම් ගිණුම් | 08 | 08 |
| (v). අරමුදල් හා ප්‍රඥප්ති ගිණුම් | 04 | 04 |
| (vi). ආදායම් ගිණුම් | 02 | 02 |
| එකතුව | 115 | 115 |

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PED/POL/CIR/2013-3 දරන 2013 ඔක්තෝබර් 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අංශයේ ආයතනවල ගිණුම් තැබීමේදී මුදල් පදනම නොව උපචිත පදනම උපයෝගී කරගත යුතු බව දක්වා තිබුණද මධ්‍යම පළාත් සභාව එම නියමය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත්කර ගැනීම සඳහා දරන ලද එකතුව රු. 87,802,947 ක වියදම සහ ඉකුත් වර්ෂවල මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ආයතන 4 ක් විසින් මිලදී ගන්නා ලද එකතුව රු. 5,615,966 ක් වන ස්ථාවර වත්කම් එම ආයතන වල විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ දක්වා නොතිබුණි.

2.2.5 අග්‍රිම ගිණුම්

-------------

පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකළ අග්‍රිම ශේෂ එකතුව රු.2,217,507 ක් වූ අතර, එම එකතුව රු.1,037,055 ක් වූ හර ශේෂයකින් හා එකතුව රු. 1,180,452 ක් වූ බැර ශේෂයකින් සමන්විත විය.

2.2.6 පොදු තැන්පත් ගිණුම්

------------------------

පළාත් භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ රු. 386,013,252 ක ශේෂයක් වූ අතර, වර්ෂ 2 ඉක්මවා තිබූ ආයතන 12 ක තැන්පත් රු.68,427,525 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.2.7 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සංචාරක දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම හා පළාත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අතර වර්ෂයේ ආරම්භක හා අවසාන ශේෂ වල රු.327,779 ක වෙනසක් විය.

(ආ) කර්මාන්ත අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ වර්ෂයේ හර හා බැර කිරීම්වල දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක සටහන් අතර පිළිවෙළින් රු.374,189 ක හා රු.374,200 ක වෙනසක් විය.

(ඇ) පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 03කට අදාළව විසර්ජන ගිණුමේ දක්වා ඇති වර්ෂයේ මුළු වියදම සහ වැය ලෙජර් අනුව වර්ෂයේ මුළු වියදම අතර රු.157,995ක වෙනසක් විය.

(ඇ) පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර සටහන් වාර්තා අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ වර්ෂයේ හර කිරීම් හා බැර කිරීම් වල පිළිවෙලින් රු.1,060,000ක හා රු.7,339ක වෙනසක් විය.

(ඉ) පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක ශේෂය, වර්ෂය තුළ මුළු හර කිරීම් සහ අවසාන හර ශේෂය දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර පිළිවෙලින් රු.270,146 ක සහ රු. 128,582 ක වෙනසක් තිබුණි.

(ඊ) පළාත් කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් 17 දෙනෙකුගේ ණය ශේෂ වල ගිණුමේ දක්වා තිබුණු කේවල ශේෂ වර්ගීකරණ ලේඛනය හා සීසී 10 ලේඛනයේ දක්වා තිබූ ශේෂ අතර රු.1,217,050 ක වෙනසක් විය.

2.2.8 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මධ්‍යම පළාත් සභාවට අයත් ආයතනවලට අනුමත අත්තිකාරම් සඳහා වූ ණය යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට දක්වා තිබූ රු. 91,430,201 ක ශේෂය තුළ රු. 75,127,908 ක ශේෂ වසර ගණනාවක සිට අයවීම් රහිතව දිගින් දිගටම නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පැවතුණු අතර, ඒවා නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

(ii) පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් ඍජු ණය යටතේ 1994 වර්ෂයේ සිට 1996 වර්ෂය දක්වා ලබා දී තිබුණු ණය මුදලින් අයවීම් හිඟ හිට තිබුණු රු.1,959,120 ක මුදල හා සණස ණය ක්‍රමය යටතේ 1994 සිට 1999 දක්වා කාලය තුළ ලබා දී ඇති නිවාස ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අය වීම් හිඟ හිට තිබුණු රු.1,206,143 ක මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

(i) පළාත් පාලන ආයතන 35 ක් වෙත ගෙවිය යුතු මුද්දර ගාස්තු රු. 527,534,903 ක් හා උසාවි දඩ රු. 13,135,118 ක් ලෙස එකතුව රු. 540,670,021 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වගකීම් ලෙස හෙළිදරව් කර නොතිබුණි.

(ii) අන්තර් පළාත් ස්ථානමාරු ණය ශේෂ නිරවුල් කිරීමේ ගිණුම යටතේ ගෙවිය යුතු ණයශේෂ 15 ක එකතුව රු. 3,975,272 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) වර්ෂ කිහිපයක සිට නොවෙනස්ව ඉදිරියට ගෙන එන, මාපනාවතුර සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුමේ රු. 1,969,736 ක ශේෂය නිරවුල් කිරීමට, සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි.

### 2.2.9 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

පළාත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් 2009, 2010 හා 2011 යන වර්ෂ වලදී විදුලි දිගු 9 ක් සැකසීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගෙවීම් කළ රු.2,729,170 ක මුදලට ඉටු කලයුතුව තිබූ ව්‍යාපෘති, වෙනත් විකල්ප යෝජනා මගින් ක්‍රියාත්මක වී ඇති බව විදුලිබල මණ්ඩලය දන්වා තිබූ නමුත් එම විකල්ප යෝජනා පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.10 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| (i) රජයේ ඉඩම් ආඥා පනත පිළිබඳ කාර්ය සංග්‍රහය 269 වගන්තිය | රජයේ ආයතන භුක්ති විඳින ඉඩම් විධිමත් පරිදි අදාළ ආයතන වෙත පවරා දීමට කටයුතු කලයුතු වුවද, රජයේ ඉඩම් භුක්ති විඳින ආයතන හා පාසල් 406 කට අදාළ ඉඩම් ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් පවරා දීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 2013 අංක 17 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් සංශෝධිත 1942 අංක 18 දරන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත | පළාත් විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවයේ නියුතු සේවකයින් 9 දෙනෙකු වෙනුවෙන් 2016 ජනවාරි සිට ජුනි දක්වා ගෙවිය යුතු රු. 209,404 ක අර්ථසාධක අරමුදල් දායකය එම අරමුදලට බැර කර නොතිබුණි. |
| (iii) 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත<br>61 වන වගන්තිය යටතේ අනුමත රීති 43(ii) | ලියාපදිංචි සමුපකාර සමිතිවල වාර්ෂික ශුද්ධ ලාභයෙන් 10% ට වැඩි නොවන හා රු. 5 ට අඩු නොවන මුදලක් සමුපකාර අරමුදලට වාර්ෂිකව දායක කළයුතු වුවත්, මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සමිති 424 කින් 2016 දෙසැම්බර් 31 දිනට අයවියයුතු රු.169,990,340 ක දායක මුදල් අයකරගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iv) | 1987 අංක 42 දරන පළාත් සභා පනත 19 (ඇ) වගන්තිය | පළාත් සභා සංකීර්ණ පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන ආපන ශාලාව කුලියට ලබා දීම වෙනුවෙන් ලද රු.512,502 ක කුලී ආදායම පළාත් සභා අරමුදලට බැර නොකර සේවක සුභ සාධක සංගමය නමින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුමකට බැර කර තිබුණි. |
| (v) | 1993 අංක 4 දරන සමූපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය 59(7) වගන්තිය | උසාවි 11 කින් එවන ලද රු. 8,672,372 ක දඩ මුදල් ලැබී වර්ෂ 1 සිට 3 දක්වා කාලයක් ගතවී තිබුණද අදාළ සමිති වෙත නිරවුල් කර නොතිබුණි. |
| (vi) | 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත හා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අංක එස්ඊසි/2015/05 දරන 2015 ජූලි 06 දිනැති චක්‍රලේඛය | මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින් 13 දෙනෙකුගෙන්, ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරින් 22 දෙනෙකුගෙන් හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් තිදෙනෙකුගෙන් 2016 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උපයන විට බදු පිලිවෙලින් රු. 190,085 ක් රු. 171,781 ක් හා රු. 278,610 ක් අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය<br>------------------ | |
| | xix පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය | උපලේඛනගත නිවාස සඳහා හිමිකම් ඇති නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට 10 ක් නිවාස කුලී ලෙස අයකරගත යුතු වුවද රජයේ නිවාස වල පදිංචි නිලධාරීන් තිදෙනෙකුගෙන් මාස 18 ක කාලයට අදාළව අයවිය යුතු රු. 81,198 ක නිවාස කුලී අයකර නොතිබුණි. |

(ඇ) මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහය (ප.මූ.රී.)
--------------------------

| | | |
|---|---|---|
| (i) | ප.මූ.රී. 54.5 හා 54.6 | සභා ලේකම් කාර්යාලයට අයත් මෝටර් රථයකට 2013 සැප්තැම්බර් 18 දින සිදු වූ අනතුර වෙනුවෙන් අවස්ථා 4 කදී රු.212,761 ක් සහ දඹුල්ල රෝහලට අයත් ගිලන් රථයක් 2015 අප්‍රේල් 10 දින අනතුරකට ලක්වීම නිසා අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.3,047,826 ක් වැය කර තිබුණු නමුත් එම අනතුරු පිළිබඳව පූර්ණ වාර්තා හෝ ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | ප.මු.රී. 116.1 | 2016 දෙසැම්බර් 31 දින වන විට දඹුල්ල ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ දීර්ඝකාලීන බදු මුදල් ලෙස පුද්ගලයින් 5 දෙනෙකුගෙන් හා ආයතන 5 කින් අයවියයුතු රු. 3,902,587 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | ප.මු.රි. 216.1.3 හා 238.1 | උප පත්‍රිකා පොත් හා මූල්‍ය වටිනාකමක් ඇති වෙනත් ආකෘති පත්‍ර සේප්පුවල හා ආරක්ෂා පෙට්ටි ආදියේ තැන්පත් කර තැබිය යුතු වුවත් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මුද්‍රණ වටිනාකම රු.1,231,650 ක් වූ වාහන ආදායම් බලපත්‍ර පොත් හා විකුණුම් වටිනාකම රු.3,750,000 ක් වූ යෝග්‍යතා සහතික පොත් අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. |
| (iv) | ප.මූ.රී.261.2.2 | තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්ය නිමවූ විගස පියවිය යුතු මෙන්ම, අත්තිකාරම් මාණ්ඩලික නිලධාරියෙකුට පමණක් ගෙවිය යුතු වුවද, ප්‍රධාන අමාත්‍යාංශය එම නියමයෙන් බැහැරව බාහිර පුද්ගලයින් සිව් දෙනෙකුට ගෙවා තිබුණු රු. 454,869 ක අත්තිකාරම් 2016 දෙසැම්බර් 31 දිනටද නිරවුල් කර නොතිබුණි. |
| (v) | ප.මූ.රී.277.2 | ලියා අත්සන් කරන ලද කිසිම චෙක්පතක් අදාළ මාණ්ඩලික නිලධාරියාගේ ලිඛිත අවසරයකින් තොරව සතියකට වැඩි කාලයක් ළඟ තබා නොගත යුතු වුවද, ආයතන 5 කින් ලියන ලද එකතුව රු. 73,564,644 ක් වටිනා චෙක්පත් 261 ක් ආදායකයින් වෙත ලබානොදී චෙක්පත් නිකුත් කරන නිලධාරි භාරයේ තබාගෙන තිබුණි. |

| | |
|---|---|
| (vi) ප.මු.රී.476 | පළාත් සභාවේ එක් අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තු හා ආයතන 6 ක, ප්‍රාදේශීය කාර්යාල හා රෝහල් ඇතුළු ඒකක 133 ක සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (vii) ප.මු.රී. 561 | මධ්‍යම පළාත් සභාවේ ආයතන 07 ක් විසින් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |

(ඈ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ

--------------------------------

| | |
|---|---|
| (i) 2006 ජනවාරි 04 දිනැති අංක CSA/PI/40 දරන චක්‍රලේඛය | ප්‍රධාන අමාත්‍යවරයෙකුට හා ඔහුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට තබාගත හැකි වාහන සංඛ්‍යාව 7 ක් වුවද, මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යවරයාට හා ඔහුගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයට වාහන 14 ක් අනුයුක්ත කර තිබුණි. |
| (ii) 2008 ජූනි 26 දිනැති අංක 13/2008 දරන චක්‍රලේඛය 4 ඡේදය | සාමාන්‍ය රාජකාරියෙන් බැහැරව විශේෂ රාජකාරියක් සඳහා නිල වාහන භාවිතා කිරීමට අවශ්‍ය වන අවස්ථාවලදී ඒ වෙනුවෙන් වැය වන අතිරේක ඉන්ධන ප්‍රතිපාදන අමාත්‍යාංශ ලේකම්වරයාගේ/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරයාගේ පෞද්ගලික අනුමැතිය මත පමණක් ලබාගත හැකි වුවත්, නිලධාරීන් තිදෙනෙකු විසින් 2016 වර්ෂයේදී රු.457,505 ක් වටිනා ඉන්ධන ලීටර් 4355 ක් අනුමැතියකින් තොරව භාවිතා කර තිබුණි. |
| (iii) 2015 ජූනි 05 දිනැති අංක CSA/1/1/83 හා 2016 සැප්තැම්බර් 05 දිනැති අංක CSA/1/3 දරන චක්‍රලේඛ | විදේශ සංචාර අත්හිටුවා තිබියදි ධාරිතා සංවර්ධන අධ්‍යයන කටයුතු සඳහා පළාත් සභා මන්ත්‍රීවරුන් හා නිලධාරීන් 64 දෙනෙකු විදෙස් සංචාරවල නිරතවීම වෙනුවෙන් රු. 24,917,057 ක මුදලක් වැයකර තිබුණි. |

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

----------------------------

| | |
|---|---|
| (i) 2013 ජුලි 05 දිනැති අංක HAF /3-ADMIN-02-00 දරන චක්‍රලේඛය<br><br>4 හා 5 වගන්ති | අනවසර අල්ලා ගැනීම්/ඉදිකිරීම් පිළිබඳ වාර්තාවක් වසම භාර ග්‍රාම නිලධාරි මගින් උඩුනුවර ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර ඇතත්,මෙ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් නිසි ලෙස ක්‍රියාත්මක වී නොතිබීම නිසා 2016 වර්ෂය තුළ අනවසර පදිංචිකරුවන් 09 දෙනෙකු සිටි බව අනාවරණය විය. |

| | | |
|---|---|---|
| (ii) | 2014 දෙසැම්බර් 26 දිනැති අංක 8/2014 දරන චක්‍රලේඛ ලිපිය | රාජ්‍ය අංශයට අයත් සියලුම වාහන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හෝ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි රක්ෂණය කළ යුතු වුවද, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය හා මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සතු වාහන 48 ක් රක්ෂණය කර නොතිබුණි. |

(ඊ) වෙනත් චක්‍රලේඛ

--------------------

| | | |
|---|---|---|
| (i) | 2000 ජුනි 30 දිනැති අංක 2000/02 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ චක්‍රලේඛය | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අයත් තනතුරකට පත්කිරීමක් හෝ එම තනතුරුවලට හෝ ඊට සමාන්තර තනතුරුවලට වැඩ බැලීම සඳහා හෝ රාජකාරි ආවරණය කිරීමට කරනු ලබන පත්කිරීමක් කළ හැක්කේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවට පමණක් වුවද, නුවරඑළිය හා වත්තේගම අධ්‍යාපන කලාපවල එවැනි තනතුරුවල වැඩ බැලීම සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ හා විදුහල්පති සේවයේ ගුරුභවතුන් 16 දෙනෙකු මධ්‍යම පළාතේ ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කර තිබුණි. |
| (ii) | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2008 සැප්තැම්බර් 19 දිනැති අංක 2008/37 දරන චක්‍රලේඛයේ 2.1(අ), (ආ) | 2 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා එක් පන්තියක සිසුන් 40 කට හා 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා එක් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 45 කට සීමා කළයුතු වුවද, එම සීමාව ඉක්මවා සරසවි උයන මහා විද්‍යාලය පිළිවෙලින් ළමුන් 278 ක් හා 89 ක් බඳවාගෙන තිබුණි. |
| (iii) | 2012 මැයි 24 දිනැති අංක 4/3/1/2001/48 දරන ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සති 72 ක කාලයක් තුළ අවසන් කළ යුතු වුවත් 2016 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 කට අදාළව තවදුරටත් වැඩ අවසන් නොවූ ලිපිගොනු 323 ක් පැවතුණි. |
| (iv) | 2015 ජනවාරි 29 දිනැති අංක 05/2015 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | සරසවි උයන මහා විද්‍යාලයේ පළමු වසරට සිසුන් ඇතුළත් කිරීමේදි සිසුවකුගෙන් රු.15,000 ක් බැගින් 2014 හා 2015 වර්ෂවලදී රු. 3,540,000 ක් හා 2016 වර්ෂයේදී රු 1,337,000 ක් අය කර ගෙන තිබුණි. |

03. ආදායම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ පළාත් සභාවේ එක් එක් ආදායම් සංකේත යටතේ ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් පහත දැක්වේ.

| ආදායම් සංකේත අංකය | ආදායම් විස්තරය | 2016 සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම | 2016 තථ්‍ය ආදායම | 2015 ඇස්තමේන්තුගත ආදායම | 2015 තථ්‍ය ආදායම |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන |
| ම -10 | නිෂ්පාදනය හා වියදම මත බදු | 6,030.66 | 6,173.57 | 5,217.95 | 5,339.45 |
| ම - 20 | විකුණුම් හා ගාස්තු | 735.34 | 806.87 | 427.05 | 775.60 |
| | එකතුව | 6,766.00 | 6,980.44 | 5,645.00 | 6,115.05 |

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හා ඉකුත් වර්ෂ දෙකක අවසානයට හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| දේපළ පැවරීම් මත මුද්දර ගාස්තු | 22,875,550 | 24,129,826 | 28,082,495 |
| රජයේ ඉඩම් පනත යටතේ ගාස්තු | 9,824,999 | 2,771,801 | 1,555,845 |
| බණිජ අයිතිවාසිකම් සම්බන්ධ බදු | 400,143 | 202,842 | - |
| ව්‍යාපාරික පිරිවැටුම් බදු | 33,920,901 | 45,381,205 | 64,656,881 |
| මත්පැන් දඩ හා පොලී | 1,725,000 | 1,725,000 | 2,325,000 |
| උකස් බඩු ගන්නන්ගෙන් අයකරන ගාස්තු | 21,000 | 21,000 | 21,000 |
| එකතුව | 68,767,593 | 74,231,674 | 96,641,221 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පළාත් මුල්‍ය රීති 41.1.4 අනුව ආදායම් ඇස්තමේන්තු තාත්වික හා නිවැරදි ලෙස පිළියෙල කළ යුතු බවට උපදෙස් දී ඇතත් අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, ආදායම් ශීර්ෂ 8 කින් 2015 වර්ෂය තුල රු.20,607,819 ක ආදායමක් ලැබී තිබුණද, ඒ සඳහා ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු අතර දීර්ඝකාලීන බදු කරුවන් දෙදෙනෙකුගෙන් 2015 වර්ෂය වෙනුවෙන් අයවිය යුතු බදු රු.1,930,858 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් අකුරණ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට ලැබිය යුතු රු.1,930,250 ක බදු ආදායම සහ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ස්විස් පුහුණු ආයතනයෙන්, රංගිරි දඹුලු විවිධ සේවා සමුපකාර සමිතියෙන් සහ දඹුල්ල ඇටවරාහේනේ පිහිටි අයර්ලන්ත සංස්කෘතික මධ්‍යස්ථානයෙන් අයවිය යුතු බදු මුදල් අය කර ගැනීමට හෝ අදාළ ඉඩම් නැවත පවරා ගැනීමට හෝ කටයුතුකර නොතිබුණි.

(iii) සී.අයි.සී ෆර්ටිලයිසර්ස් පෞද්ගලික සමාගමට 2001 අගෝස්තු 31 දින සිට වසර 50 ක කාලයකට බදු දී තිබූ ඉඩමෙහි බදු ගණනය කිරීම වැරදි ලෙස සිදු කිරීම නිසා රු.3,003,921 ක බදු මුදලක් හිඟව පැවතුණි.

(iv) බිම් සවිය වැඩසටහන යටතේ පුද්ගලයින් 19 දෙනෙකුගෙන් රු.3,913,000 ක් 2017 ජනවාරි දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දීර්ඝ කාලීන බදු ගිවිසුම් වලට එළඹීමට පවතින ක්‍රියාවලියේ අසාමාන්‍ය ප්‍රමාදය නිසා, රජයට බදු මුදල් අයකර ගැනීමට නොහැකි වීමෙන් විශාල පාඩුවක් සිදුව තිබුණි.

(v) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු මුළු තීරක මුදල වූ රු.54,599,722 කින් රු.8,672,379 ක් අවිනිශ්චිත උසාවි දඩ මුදල් හා රු.2,032,456 ක් නොකැඳවූ අභියාචනා මුදල් වූ අතර ඉතිරියවූ රු.43,894,887 ක් හඳුනාගෙන නොතිබුණි. මේ අනුව සමිතිවලට නිරවුල් විය යුතු උසාවි දඩ මුදල් නොකැඳවූ අභියාචනා ආදිය නිරවුල් කිරීම අවිධිමත් තත්ත්වයක පැවතුණි.

04. මූල්‍ය සමාලෝචනය
-----------------------

4.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.27,415,737,187 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 25,670,888,447 ක් විය.

4.2 ව්‍යූහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

ආදායම් හා වියදම්
--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2016 | | | 2015 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| <u>ආදායම්</u> | | | | | | |
| බදු ආදායම් | 6,030.65 | 6,173.57 | (142.92) | 5,217.95 | 5,339.45 | (121.5) |
| බදු නොවන ආදායම් | 735.34 | 806.87 | (71.53) | 427.04 | 775.59 | (348.55) |
| රජයේ ප්‍රදාන | 23,374.86 | 23,374.86 | - | 24,678.11 | 23,542.11 | 1,136.00 |
| ප්‍රදාන නොවන වෙනත් ලැබීම් | 12,988.52 | 3,221.87 | 9,766.65 | 4,414.48 | 3,927.45 | 487.03 |
| එකතුව | 43,129.37 | 33,577.17 | 9,552.2 | 34,737.58 | 33,584.6 | 1,152.98 |
| <u>පුනරාවර්තන වියදම්</u> | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 23,783.93 | 23,651.28 | 132.65 | 23,254.55 | 23,076.32 | 178.23 |
| අනෙකුත් වියදම් | 6,245.99 | 5,648.21 | 597.78 | 5,393.84 | 4,921.69 | 472.15 |
| උප එකතුව | 30,029.92 | 29,299.49 | 730.43 | 28,648.39 | 27,998.01 | 650.38 |
| ප්‍රාග්ධන වියදම් | 12,989.01 | 5,096.68 | 7,892.33 | 4,799.64 | 3,787.92 | 1,011.72 |
| එකතුව | 43,018.93 | 34,396.17 | 8,622.76 | 33,448.03 | 31,785.93 | 1,662.1 |

## 05. ප්‍රඥප්ති ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්

මධ්‍යම පළාත් සභාවේ ස්ථාපිත ප්‍රඥප්ති ගිණුම් 2 කට සහ වාණිජ අත්තිකාරම් ගිණුම් 2 කට මතයක් ප්‍රකාශ කර නොමැති අතර වාණිජ අත්තිකාරම් ගිණුම් 3 ක් සඳහා තත්ත්වාගණනය කල මතයක් ප්‍රකාශ කර ඇත.

### 5.1 ප්‍රඥප්ති ගිණුම්

#### 5.1.1 මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂ 3 කට පෙර සිට බිල් කරන ලද රු.1,208,900 ක් වූ හිඟ පාසල් සේවා බලපත්‍ර ගාස්තු හා අධිභාර මුදල් සමාලෝචිත වර්ෂය තුළදී කපා හැර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට 2014, 2015 හා 2016 යන වර්ෂයන් සඳහා හිඟ ආදායම් ලෙස රු.2,326,400 ක ශේෂයක් පෙන්නුම් කර තිබුණි.

(ආ) එකතුව රු.9,827,330 ක් වූ ගිණුම් විෂයයන් 6 කට අදාළ ස්ථාවර වත්කම් ලේඛන, සමීක්ෂණ වාර්තා, උපයෝගී ලේඛන හා ශේෂය සැදුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් 2017 පෙබරවාරි මාසයේ පරිගණක දත්ත පද්ධතිය සඳහා රු.837,825 ක මුදලක් ගෙවීම් කර තිබුණද, පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. ව්‍යාපෘති වාර්තාව අනුව පොදු ලෙජර පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි.

(ඈ) සහසර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මගින් අධිකාරිය වෙත ලබා දී තිබුණු රු.25,000,000 ක මුදලින් රු.16,434,074 ක් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවා රු.8,000,000 ක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. මේ අනුව රු.24,434,074 ක මුදල් අරමුණින් බැහැරව යොදවා තිබුණි.

(ඉ) 1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනතේ විධිවිධාන සහ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2016 දෙසැම්බර් 31 වන විටද පාරිතෝෂික වෙන් කිරීමක් කර අරමුදලක් ගොඩනගා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය දක්වා වෙන් කළ යුතු පාරිතෝෂික ප්‍රතිපාදන මුදල රු.49,736,853ක් විය.

5.1.2 මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

-----------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය ආයතන 55 කින් අයවිය යුතු වර්ෂ 1 සිට 6 දක්වා කාල පරාසයකට අයත් රු.3,403,023 ක වාහන අලුත්වැඩියා ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) මාර්ග සංවර්ධනයේදී තම දේපලවලට හානි වූ බවට පුද්ගලයන් 4 දෙනෙකු විසින් අධිකාරියට එරෙහිව නඩු පවරා තිබූ අතර ඒ සඳහා රු.6,221,688 ක වන්දි මුදලක් ඉල්ලා තිබුණි. එම නඩු 4 ඇතුළුව නඩු 9 ක් අධිකරණයේ විභාග වෙමින් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග නඩත්තු කිරීම සඳහා රු.190,000,000 ක ප්‍රතිපාදන මුදලක් ලැබී තිබුණද ඉන් සියයට 39 ක් වන රු.73,943,031 ක් පමණක් මාර්ග නඩත්තු කටයුතු සඳහා වැය කර සියයට 61 ක් වන ඉතිරිය වූ රු.116,056,969 ක් සේවක වැටුප් ගෙවීමට උපයෝගී කර ගෙන තිබුණි.

5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

------------------------------

5.2.1 මධ්‍යම පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ විෂය අංක 581202 දරන පේෂකර්ම වැඩපළ පිහිටුවීම හා පරිපාලනය පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම

---------------------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ඉකුත් වර්ෂවල සිට පැවත එන ණයට විකුණුම්වලින් අය විය යුතු රු.11,688,914 ක් සමාලෝචිත වර්ෂය අවසානයට ද අයකරගෙන නොතිබුණි.

(ආ) 2015 හා ඊට පෙර සිට පැවත එන රු.1,589,283 ක තොග අලෙවි ශේෂය, රු.5,225,818 ක ලැබිය යුතු ඌනතා ශේෂය හා වර්ෂ ගණනාවක සිට ප්‍රධාන ලේකම් නමින් පැවත එන රු.16,712,065 ක ලැබිය යුතු ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.23,456,086 ක නූල් තොගයක් වූ අතර, වර්ෂය තුළදී රු.29,757,276 ක නූල් තොග මිලදී ගෙන තිබුණි. එහෙත් වර්ෂය තුළදී භාවිතා කර තිබුණේ රු.22,135,004 ක නූල් තොග පමණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයට රු.2,451,042 ක ඩයි හා රසායනික ද්‍රව්‍ය තොගයක් වූ අතර, වර්ෂය තුළදී රු.4,018,679 ක ඩයි හා රසායනික ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. එහෙත් වර්ෂය තුළදී භාවිතා කර තිබුණේ රු.2,360,282 ක ඩයි හා රසායනික ද්‍රව්‍ය පමණක් විය.

(ඉ) දෙපාර්තමේන්තුව සතු පේෂකර්ම මධ්‍යස්ථාන 145 න් මධ්‍යස්ථාන 36 ක ජලය හා විදුලිය ද, මධ්‍යස්ථාන 20 ක ජලයද, මධ්‍යස්ථාන 13 ක විදුලියද වශයෙන් මධ්‍යස්ථාන 69 ක මූලික පහසුකම් නොතිබුණු අතර ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් නොමැති වීම හා අනිකුත් හේතූන්මත වර්ෂය තුලදී මධ්‍යස්ථාන 12 ක් වසා දමා තිබුණි.

5.2.2 අංක 552202 ගුරුදෙණිය අධ්‍යාපන සංවර්ධන කේන්ද්‍රයේ වාණිජ අත්තිකාරම් ගිණුම

-----------------------------------------------------------------------------------------------

පුහුණු මධ්‍යස්ථානය සතු අක්‍රීය විදුලි ජනන යන්ත්‍රයක් අළුත්වැඩියාවක් සිදුනොකර වර්ෂ ගණනාවක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණු අතර රු.1,299,300 ක පිරිවැයකින් නිමවූ ආකාශ නැරඹුම් මධ්‍යස්ථානයක් හා රු.341,000 ක වටිනාකමකින් යුතු ආකාශ වස්තු උපකරණ අයිතම 10 ක් වර්ෂ 2 කට අධික කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

5.2.3 අංක 550202 - මාපනාවතුර සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම

-------------------------------------------------------------------------

පාසල් ලී බඩු නව නිෂ්පාදන වසර කිහිපයක සිට නවතා තිබීම නිසා අළුත්වැඩියාවන්ට පමණක් අමුද්‍රව්‍ය යොදාගනිමින් තිබුණි. එහෙත් අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය නිවැරදිව ඇස්තමේන්තු නොකර අවශ්‍යතාවය ඉක්මවා අයිතම් 5 ක් මිලදී ගැනීම සඳහා රු.2,329,273 ක් වියදම් කිරීම හේතුවෙන් වර්ෂය අවසානයේ රු.2,493,621 ක් වටිනා අමුද්‍රව්‍ය තොග නිෂ්කාර්යව පැවතුණි.

5.2.4 අංක 550203 හැටන් සම්පත් මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම

---------------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) යම්කිසි නිලධාරියෙකුගේ ප්‍රමාදයක්, නොසැලකිල්ලක්, වරදක් හෝ වංචාවක් හේතුවෙන් පළාත් සභාවට වන පාඩුවක් අදාල නිලධාරියාගෙන් අය කරවාගත යුතු වුවද ස්ථාන භාර නිලධාරි විසින් තම අභිමතය පරිදි බිල් නොකළ රු.2,631,800 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රතිඵලය 2012 වර්ෂයේදී රු.11,209,653 ක් වූ අතිරික්තය ක්‍රමයෙන් අඩුවී සමාලෝචිත වර්ෂයේදී රු.25,064 ක ඌනතාවයක්වී තිබුණද කළමනාකාරීත්වය විසින් මේ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

5.3 අනෙකුත් අත්තිකාරම් ගිණුම්
---------------------------------

5.3.1 පළාත් රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්
-----------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් කටයුතු සම්බන්ධයෙන් පනවා තිබූ අවම ලැබීම් සීමාවට ආයතන 7 ක් ළගාවී නොතිබූ අතර ආයතන 2ක් වියදමේ උපරිම සීමාව ඉක්මවා තිබුණි.

(ආ) ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ආයතන 13 ක පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ලබා දීම් සඳහා වෙන් කර තිබූ රු. 1,925,050 ක ප්‍රතිපාදන සියයට 100 ක් ම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් පිළිබඳව 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ සැසඳුම් ප්‍රකාශ 6 ක අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,268,152 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අය කර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඈ) පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව, ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර 27 දෙනෙකුට රු.2,045,424 ක ආපදා ණය ගෙවා තිබුණි.

(ඉ) පළාත් ජේෂකර්ම දෙපාර්තමේන්තුවේ වර්ෂය අවසාන වන විට නිලධාරින් 6 දෙනෙකුගෙන් වැඩිපුර අය කර ගෙන තිබුණු රු.352,855 ක් වූ මුදල නිරවුල් කර නොතිබුණි.

5.3.2 පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා අත්තිකාරම් ගිණුම
--------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ණය යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් 2001 මාර්තු 28 දිනැති අංක මුදල් /01/2001 දරන පළාත් සභා හා පළාත් පාලන චක්‍රලේඛයෙහි 6 ඡේදය ප්‍රකාරව ධුර අහිමි වූ මන්ත්‍රීවරුන් 6 දෙනෙකුට අදාළව රු. 1,653,678 ක් වූ ණය අත්තිකාරම් අයකර නොගෙන වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) ධූරය හැරගිය හිටපු පළාත් සභා මන්ත්‍රීවරයකුගෙන් අය නොවී පවතින රු.157,114 ක ණය ශේෂය 2006 සැප්තැම්බර් 04 දින සිට 2016 දෙසැම්බර් 31 දක්වා අවුරුදු 10 කට වැඩි කාලයක සිට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

06. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

6.1 කාර්යසාධනය
----------------

(අ) මධ්‍යම පළාතේ සෞඛ්‍ය හා පෝෂණයට සම්බන්ධ තොරතුරු කිහිපයක් ජාතික සාමාන්‍ය දත්ත සමඟ සසඳා පහත දැක්වේ.

| කාරණය | වර්ෂය | දිස්ත්‍රික්කය | | | මධ්‍යම පළාත | ජාතික |
|---|---|---|---|---|---|---|
| | | මහනුවර | මාතලේ | නුවරඑළිය | | |
| ------------- | -------- | --------- | --------- | ----------- | --------- | -------- |
| මාතෘ මරණ අනුපාතය(MMR) (සජීවී උපත් 100,000 කට) | 2014 | 30.5 | 10.6 | 62.7 | 37.6 | 32.0 |
| වයස අවුරුදු 5 ට අඩු ළමා මරණ අනුපාතය (සජීවී උපත් 1,000 කට) | 2014 | 10.0 | 13.0 | 11.8 | 11.1 | 9.9 |
| ළදරු මරණ අනුපාතය (IMR) (සජීවී උපත් 1,000 කට) | 2014 | 8.6 | 11.8 | 10.1 | 9.7 | 8.6 |
| නවජ මරණ අනුපාතය (NNMR) (සජීවී උපත් 1,000 කට) | 2014 | 8.7 | 8.9 | 6.1 | 7.9 | 6.2 |
| වෛද්‍ය නිලධාරීන් ජනගහනයෙන් 100,000 කට | 2015 | 100 | 55 | 33 | 73 | 77 (2014) |
| හෙද නිලධාරීන් ජනගහනයෙන් 100,000 කට | 2015 | 239 | 115 | 62 | 166 | 189 (2014) |
| රෝහල් ඇඳන් ගණන ජනගහනයෙන් 1,000 කට | 2015 | 4.5 | 3.2 | 2.4 | 3.7 | 3.9 (2014) |

(ආ) මධ්‍යම පළාතේ රෝහල් 8 ක 2015 වර්ෂයේදී සිදුවූ උපත් 24,866 කින් 14,733 ක් හෙවත් සියයට 59 ක් අඩු බර උපත් බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මාතලේ දිස්ත්‍රික්කයට අයත් රෝහල් වල භාවිතය සඳහා කොළඹ ප්‍රධාන වෛද්‍ය සැපයුම් අංශයෙන් ඉල්ලුම් කළ ඖෂධ වලින් වර්ග 50 කට අයත් ඖෂධ කිසිවක් ලැබී නොතිබුණු අතර වර්ග 26 කට අයත් ඖෂධ වලින් ලැබී තිබුණේ සියයට 35 කටත් අඩු ප්‍රතිශතයක් පමණි. මෙය රෝගී සත්කාර සේවාව යහපත් ලෙස පවත්වාගෙන යාමට බාධාවක්ව තිබුණි.

(ඈ) මධ්‍යම පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රධාන මෙහෙවර, දැනුම හා තොරතුරු නිදහස්ව සහ අඛණ්ඩව පරිහරණය කිරීමට උපරිම අවස්ථාව ලබාදීම තුලින් ඵලදායි හා කාර්යක්ෂම කාර්ය සාධනයක් මානව සම්පත වෙත ලබාදීම වුවද රු.7,000,000 ක වටිනාකමින් යුතු පුස්තකාල පොත් 14928 කින් සමන්විත පළාත් පුස්තකාලයේ පොත් පරිශීලනය කරන ලියාපදිංචි පාඨකයින් ගණන 145 ක් වූ අතර බාහිර පරිශීලනය කරන්නන් ගණන 20 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මධ්‍යම පළාතේ විභාග ප්‍රතිඵල අධ්‍යයනයේදී 5 වසර ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත්වූ සිසුන් අතුරින් 11,996 ක් එනම් සියයට 27 ක් ලකුණු 70 ට අඩුවෙන් ලබාගෙන තිබුණු අතර අ.පො.ස(සා.පෙළ) විභාගයට ඉදිරිපත් වූ සිසුන් 37,665 ක් අතුරින් සිසුන් 11,733 ක් අසමත්වී තිබුණි. ඉන් සිසුන් 1,225 ක් එනම් සියයට 3.25 ක් සියලුම

විෂයයන් අසමත්ව තිබුණු අතර ගණිතය විෂය සඳහා පෙනී සිටි සිසුන්ගෙන් සියයට 44.8 ක් ද විද්‍යාව විෂය සඳහා පෙනී සිටි සිසුන්ගෙන් සියයට 41 ක්ද, ඉංග්‍රීසි විෂයය සඳහා පෙනීසිටි සිසුන්ගෙන් සියයට 60 ක්ද අසමත්වී තිබුණි. එසේම අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වූ සිසුන් 26,654 දෙනෙකුගෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව 16,524 ක් හෙවත් සියයට 62 ක් වූ අතර 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී භෞතික විද්‍යාව, කලා, වෙනත්, ජෛව හා ඉංජිනේරු තාක්ෂණවේදය සමත්වීමේ ප්‍රතිශතයේ වර්ධනයක් පැවතියද ජීව විද්‍යාව හා වාණිජ විෂය ධාරාවන්ගේ සමත්වීමේ ප්‍රතිශතය අඩුවී තිබුණි. එය පිළිවෙලින් සියයට 1.16 ක් හා සියයට 0.74 ක් විය.

(ඊ) පළාත් කර්මාන්ත අමාත්‍යාංශයේ වනිතා සංවර්ධන අංශය විසින් 2014,2015 වර්ෂ වල හා 2016 සැප්තැම්බර් 30 දක්වා රු.5,088,992 ක වියදමක් දරා මධ්‍යම පළාත් කාන්තාවන් සඳහා ආදායම් උත්පාදන ව්‍යාපෘති හඳුන්වා දීම, සමාජීය හා ආර්ථික තත්ත්වය නැංවීම අරමුණු කරගෙන පුහුණු වැඩසටහන් පවත්වා තිබුණද එමගින් ඔවුන් සැබෑ ප්‍රතිලාභ ලබා තිබේද යන්න පිළිබඳ පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ

(අ) මහනුවර ප්‍රාදේශීය ඖෂධ ගබඩාවේ 2001 වර්ෂයේ ගබඩා සමීක්ෂණයේදී අනාවරණය වූ රු. 1,217,482 ක ගබඩා ද්‍රව්‍ය ඌනතාවය සම්බන්ධයෙන් මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ආ) උකුවෙල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ කළල්පිටිය ජේෂකර්ම ආයතනය අසල 108/1 දරන ලිපිනයේ වසර 16 ක පමණ කාලයක සිට අනවසරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන පුද්ගලයකුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) පළාත් සංචාරක දෙපාර්තමේන්තුව විසින් ගිවිසුමක් හෝ ලිඛිත අනුමැතියක් රහිතව කලාපීය ආර්ථික සංවර්ධන ආයතනයට ලබාදී තිබූ මාතලේ හෝටල් පාසල හා ශ්‍රවණාගාරයේ විදුලිය, ජලය, දුරකථන, පවිත්‍රතා සේවා, ආරක්ෂක සේවා හා වැටුප් ගෙවීම සඳහා 2016 වර්ෂයේදි රු.2,937,547 ක් වැයකර තිබුණි.

(ඈ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමූපකාර අරමුදලෙන් සමිති 17 ක් සඳහා නිකුත් කරන ලද රු.4,165,291 ක් වූ ණය වර්ෂ 9 සිට 25 දක්වා කාලයක සිට අයකරගත නොහැකිව පැවතුණි.

(ඉ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තු භාරකාර අරමුදලේ පැවති ලියාපදිංචිය අවලංගු කල සමිති 77 කට අදාල රු.6,088,816 ක මුදලක්, තැන්පත් කර වර්ෂ 10 සිට 12 දක්වා කාලයක් ගතවී තිබුණද, එම සමිතිවල ඈවර කටයුතු අවසන් කර වගකීම් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) මධ්‍යම පළාත් පරිපාලන සංකීර්ණය පිහිටි ඉඩම පවරා ගැනීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට රු.834,243 ක් ගෙවා තිබුණද මේ වනවිටත් පවරාගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(උ) 2014 ඔක්තෝබර් 24 දිනැති අංක 2014/06 දරන ඉඩම් කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව හා ඉඩම් ආඥාපනතේ 19 (4) වගන්තිය ප්‍රකාරව විධිමත් අනුමැතියකින් තොරව දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සම්ප්‍රේෂණ කුළුණ සඳහා ඉඩම් කොටස් 10 ක් බැහැර

කර තිබූ අතර එම ඉඩම් කොටස් රජයට පවරාගෙන විධිමත්ව දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබා දීමට කටයුතු කර නොතිබුණි. මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දීමනා පත්‍රයේ කොන්දේසි කඩකරමින් බෙදාදිය නොහැකි ඉඩම් කොටසක ප්‍රමාණයක් බැහැර කර පුද්ගලික දුරකතන ආයතනයකට අතුරු බදු දීමට ක්‍රියාකරමින් පැවතුණි.

(ඌ) මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ලේ කොටසක් මහජන බැංකු ශාඛාවක් පවත්වාගෙන යාම සඳහා කුලියට දී තිබුණු අතර රජයේ තක්සේරුවට අනුව කුලී අය නොකිරීම හේතුවෙන් රු.662,500 ක මුදලක් පළාත් සභා අරමුදලට අහිමි වී තිබුණි.

(එ) පුස්තකාල සේවා මණ්ඩලය පිහිටි ගොඩනැගිල්ලෙන් කොටසක් E-wis ආයතනයට ලබාදීම වෙනුවෙන් 2015 සැප්තැම්බර් 30 දිනට අයවිය යුතු රු. 604,538 ක් සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඒ) අධ්‍යාපන දෙපාර්තමේන්තුව 2005 වර්ෂයේ සිදුකර තිබූ වාහන එන්ජින් අලුත්වැඩියාවක් වෙනුවෙන් නියමිත දිනට මුදල් නොගෙවීම මත ගෙවීමට සිදුවූ රු. 82,488 ක නඩු ගාස්තුව වගකිව යුත්තන්ගෙන් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 1950 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රජයේ ඉඩම් අල්ලාගත් අනවසර පදිංචිකරුවන් 32 දෙනෙකු සිටියද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) පාසල් 5 ක් හා කලාප අධ්‍යාපන කාර්යාලයක් විසින් අවස්ථා 9 කදී තැන්පත් කරන ලද ඉදිකිරීම් වලට අදාළ ඉතිරි මුදල් රු.2,936,794 ක් මැදරට වංශ කථාව මුද්‍රණය කිරීමට ලබා දුන් රු.1,967,500 ක මුදල් සහ වල්ගම හා දිගම්පතන වැව් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව වෙන් කරන ලද රු.1,138,000 ක මුදල් සුදුසු කටයුත්තකට යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) වත්තේගම කලාප අධ්‍යාපන කාර්යාලයේ සහ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ වැටුප්වලින් අවකරණය කරන ලද ගංවතුර ආධාර පිළිවෙලින් රු.43,697 ක් සහ රු.173,520 ක් අදාළ කාර්යය සඳහා ලබානොදී පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඈ) නාවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පළාත් ඉඩම් කොමසාරිස් වෙතින් ලද රු. 459,037 ක මුදලක්, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2011 සිට 2013 වර්ෂය දක්වා කාල පරාසය තුළ අවස්ථා 4 කදී තැන්පත් කරන ලද රු.2,252,500 ක මුදලක්, වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ රු.3,857,000 ක මුදලක් හා ප්‍රධාන අමාත්‍යාංශයට වර්ල්ඩ් විෂන් ආයතනයෙන් ලද රු. 1,886,011 ක මුදලක් අදාළ කාර්යයන් සඳහා යොදා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඉ) 2015 වර්ෂයේදී මිලදී ගන්නා ලද වටිනාකම රු.162,000 ක් වූ ශ්‍රවණ උපකරණ 18 ක් ශ්‍රවණ ආබාධිතයන් වෙත නිකුත් නොකර ගබඩාවේ රඳවා තිබුණි.

(ඊ) පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට කුඩා පරිමාන ජල විදුලි බලාගාර 2 කින් අයවියයුතු ජල හැරවුම් බදු හා දඩ මුදල රු.4,180,000 ක් අයකර නොතිබුණු අතර පුද්ගලික සමාගමක් විසින් 2008 වර්ෂයේ සිට විදුලිබල මණ්ඩලය වෙත අලෙවි කළ විදුලි ඒකක පදනම් කරගත් බදු හා ජලය හරවා ගැනීම සඳහා වන බදු අයකර ගැනීමට උඩපළාත ප්‍රාදේශීය ලේකම් කටයුතු කර නොතිබුණි.

(උ) බාර්කේපල් කුඩා පරිමාන ජල යෝජනා ක්‍රම I හා II සඳහා ජල බදු ගණනය කර දන්වන මෙන් 2008 ජූලි හා 2012 සැප්තැම්බර් මාසවලදී අදාළ සමාගම විසින් කරන ලද ඉල්ලීම් වලට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ප්‍රතිචාර දක්වා තිබුණේ 2016 සැප්තැම්බර් මාසයේදී වන අතර අදාළ නිලධාරීන් නිසි වගකීමෙන් යුතුව කටයුතු නොකිරීම ජල හැරවුම් බදු අයකිරීම ප්‍රමාදවීමට හේතුවී තිබුණි. තවද බාර්කේපල් II ජල විදුලි බලාගාරයේ ධාරිතාව මෙගා වොට් 4.5 ක් වුවත්, ධාරිතාව මෙගා වොට් 4 ක් ලෙස අඩු කොට ජල හැරවුම් බදු හා දඩ මුදල් ගණනය කර තිබීම නිසා සිදුව තිබූ පාඩුව රු.275,000 ක් විය.

(ඌ) නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක වෙමින් පවතින කුඩා ජල විදුලි බලාගාර සඳහා ජල හැරවුම් බලපත්‍ර ලබා නොදීමෙන් 2014 සිට 2016 දක්වා කාලයට අදාළව පමණක් අවම වශයෙන් රු.1,740,000 ක ජල හැරවුම් බදු ආදායමක් අහිමිව තිබුණි.

(එ) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ඇති රජයේ ඉඩම් කට්ටි 6 ක් දීර්ඝ කාලීනව බදු දීමේ ක්‍රියාවලිය ආරම්භ කර වසර 3 - 21 අතර කාල ප්‍රමාදයක් ගතව ඇතත් මේ දක්වා බදු දීමට කටයුතු කර නොතිබීමෙන් රජයට අය කර ගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණු අතර දීමනා පත්‍ර ඉඩමකින් පර්චස් 20 ක බිම් කොටසක් අනුමැතියකින් තොරව පුද්ගලික දූරකථන සමාගමක් වෙත බැහැර කර තිබුණි.

(ඒ) 1985-2010 කාලය තුළ විධිමත් පරිදි අත්සන් කරන ලද දීමනා පත්‍ර 198 ක් බෙදා නොහැර දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවාගෙන තිබුණු අතර ඉන් 128 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි. මෙම දීමනා පත්‍ර වලින් 47 ක නම් සඳහන් පුද්ගලයින් අදාළ ඉඩම් භුක්ති නොවිඳින බවට හඳුනාගෙන ඇතත් ඉදිරි කටයුතු කර නොතිබුණි. එම කාලය තුළ විධිමත්ව අත්සන් කර එවන ලද ඉතිරි දීමනා පත්‍ර 70 ක් හා 2015 – 2016 කාලය තුළ එවා තිබූ දීමනා පත්‍ර 38 ක් ලියාපදිංචි කර තිබුණද අදාළ පුද්ගලයන් වෙත බෙදා හැර නොතිබුණි.

(ඔ) 1982 සිට 2009 කාලපරිච්ඡේදය තුළ අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පුද්ගලයින් 112 දෙනෙකු හා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පුද්ගලයින් 65 දෙනෙකු වෙත ලියන ලද ස්වර්ණභූමි ප්‍රදාන පත්‍ර 6 ක් ,ජය භූමි ප්‍රදාන පත්‍ර 58 ක් සහ ඉසුරුභූමි ප්‍රදාන පත්‍රයක් 2017 පෙබරවාරි වන විටද අදාළ පුද්ගලයන් වෙත ලබා දී නොතිබුණි.

6.4 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් නොකල කෘෂි මාර්ග වෙනුවෙන් රු.8,118,788 ක් හා වතු මාර්ග වෙනුවෙන් රු.4,653,567 ක් ලෙස එකතුව රු.12,772,355 ක් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ගෙවීම් කර තිබුණි.

(ආ) වතු මාර්ග සංවර්ධනය වැය විෂය යටතේ අරමුණට පටහැනි වතු මාර්ගයක් හා කෘෂි මාර්ග නොවන මාර්ග දෙකක් සංවර්ධනය සඳහා රු.1,674,054 ක වියදමක් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් දරා තිබුණි.

(ඇ) එන්හිල්ස් වතු මාර්ගය, ලබුකැලේ ඉහල කොටස මාර්ගය , ස්මෝල් ඩ්‍රේටන්වත්ත යදන්සෙට් වතු මාර්ගය I සහ II අදියර , වෙදමුල්ල ලිස්ලෑන්ඩ් කෘෂි මාර්ගය, දකුණ මඩකුඹුර වතුමාර්ගය හා දික්ඔය දෙමළ විද්‍යාලය මාර්ග සංවර්ධනයේදී නිසි ලෙස වැඩ අවසන්ව නොතිබියදී එකතුව රු. 9,035,041 ක් ගෙවා තිබුණි.

6.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට අයත් ජනසවිගම ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම හා ඇවිදින මංතීරු ඉදිකිරීම සඳහා මුළු ඇස්තමේන්තුගත වියදම රු.6,447,600 ක් වුවද 2015 වර්ෂය අවසාන වනවිට ඒ සඳහා රු.10,415,911 ක් වැය කර තිබුණු අතර වැඩබිමට සපයා තිබුණු රු.242,318 ක් පමණ වන ද්‍රව්‍ය අදාළ ඉදිකිරීම් සඳහා යොදාගෙන නොතිබුණි. එසේම මෙය 2014 සැප්තැම්බර් මස විවෘත කරන ලද දින සිට නිෂ්කාර්යව වල්බිහිවී තිබුණි.

(ආ) ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මධ්‍යම පළාතේ පාසැල් හැරගිය ළමුන් 300 ක් සඳහා හෝටල් සත්කාරක සේවය පිළිබඳ සිව්මාසික පුහුණු වැඩසටහන් පැවැත්වීමට කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය වෙත රු.මිලියන 6.75 ක් ගෙවා තිබුණද පාඨමාලාව සඳහා ශිෂ්‍යයකු වෙනුවෙන් අමාත්‍යාංශයේ දායකත්වය රු.15,000 ක් වීමෙන් රු.මිලියන 2.25 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ හදිසි සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් සලසා තිබුණ රු.1,500,000 ක් වූ ප්‍රතිපාදන වලින්, හදිසි සංවර්ධන අවශ්‍යතා වශයෙන් තහවුරු නොවන හින්දු සංස්කෘතික කටයුතු කාර්යයන් දෙකක් වෙනුවෙන් රු.1,299,040 ක් වැයකර තිබුණි.

(ඈ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැඩ අවසන් කර නොතිබුණු කර්මාන්ත 3 කට රු.6,388,522 ක චෙක්පත් ලියා වියදම් ලෙසට 2016 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර තිබුණි.

6.6 දෘෂ්‍ය අක්‍රමිකතා

-------------------

සරසවි උයන මහා විද්‍යාලේ පහසුකම් හා සේවා ගාස්තු අයකිරීමේදී එක් ලදුපත් පොතකින් ලබාගත හැකිව තිබූ උපරිම මුදල රු.6,000 ක් වුවද අංක 526901 සිට 527000 දක්වා වූ ලදුපත් පොතින් රු.164,840 ක් රැස්කර තිබුණි.

6.7 අරමුදල් ඌන උපයෝජනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) පාසල් හැරයන තරුණ තරුණියන් රැකියා අවස්ථා සඳහා යොමු කිරීමේ ව්‍යාපෘති 2 ක් සඳහා පිළිවෙලින් රු.380,000 ක හා රු.10,100,000 ක මුදල් කලාපීය ආර්ථික සංවර්ධන

ආයතනයට ලබාදී තිබුණද 2016 දෙසැම්බර් 31 දින වනවිට මෙම ව්‍යාපෘති වලට අදාළ කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) බිඟු පාලනයට යොමුවීම තුලින් මී පැණි නිෂ්පාදනය ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතියට ලබාදුන් රු.680,000 ක මුදලින් 2016 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු මුදලක් වැයකර නොතිබුණි.

(ඇ) ඒකාබද්ධ අධ්‍යාපන සංවර්ධන වැඩසටහන යටතේ වැඩසටහන් 8 ක් වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.1,000,000,000 ක් ප්‍රතිපාදනය කර තිබූ නමුත් ඉන් රු.513,558,845 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

(ඇ) ප්‍රධාන අමාත්‍යාංශය 2016 වර්ෂයේ අවස්ථා 3 කදී එකතුව රු.7,413,273 ක් වූ වැඩසටහන් 3 ක් වෙනුවෙන් වර්ල්ඩ් විෂන් ආයතනය සමඟ ගිවිසුම්ගතවී තිබුණි. 2016 සැප්තැම්බර් 30 දිනට ගිවිසුම් කාලය ඉකුත්වී තිබුණද ඊට අදාල වැඩසටහන්වල භෞතික ප්‍රගතිය හෝ ගිවිසුම් දින දීර්ඝ කිරීම් නිරීක්ෂණය නොවීය. එම වැඩසටහන් වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.2,296,753 ක මුදල් ලැබී තිබුණු අතර 2017 පෙබරවාරි 14 දින වනවිට රු.410,742 ක් ගෙවීම් කර ඉතිරිය වූ රු.1,886,011 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඉ) දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය (TSEP) යටතේ මධ්‍යම පළාත් අධ්‍යාපනයට රු.මිලියන 431.9 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර කලාප අධ්‍යාපන කාර්යාල වෙත වෙන්කළ ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 41.4 ක් ඉතිරිවී තිබුණි. ව්‍යාපෘතියේ තේමා යටතට නොවැටෙන මිලදී ගැනීම් සඳහා රු.මිලියන 10.7 ක් හා පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා රු.මිලියන 6.9 ක් ද වැයකර තිබුණු අතර ඉටුකිරීමට නියමිතව තිබුණු කර්මාන්ත 89 කින් කර්මාන්ත 56 ක භෞතික ප්‍රගතිය සියයට 20 ක් විය. තවද කර්මාන්ත 26 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ආරම්භ කර නොතිබූ අතර වැඩ (Works) සඳහා වෙන්කල ප්‍රතිපාදන මුදලින් රු. මිලියන 119.3 ක් එනම් සියයට 81 ක් ඉතිරි වී තිබුණි.

(ඊ) "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ 2016 වර්ෂය සඳහා ගලේවෙල කලාපයේ පාසැල් 3 කට අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබාදී තිබුණු රු.4,500,000 ක මුදල් උපයෝජනය නොකර පාසල් සංවර්ධන ගිණුමේ තැන්පත් කර තිබුණි.

(උ) නුවරඑළිය අධ්‍යාපන කලාපයේ පාසැල් 59 ක් සඳහා ගුණාත්මක සංවර්ධන යෙදවුම් වෙනුවෙන් ඉකුත් වර්ෂවලදී ලබාදෙන ලද රු.2,817,160 ක මුදලින් රු.2,263,049 ක් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු වන විටත් උපයෝජනය කර නොතිබුණි.

(ඌ) ආණ්ඩුකාර නිල නිවස අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.17,000,000 ක පරිපූරක ඇස්තමේන්තුවක් ද සමගින් රු.18,000,000 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබුණද දෙසැම්බර් 31 දින වන විට අපේක්ෂිත වැඩ නිමකර නොතිබීම හේතුවෙන් රු.12,048,375 ක් හෙවත් සියයට 67 ක මුදලක් ඉතිරිව පැවතුණි.

(එ) පළාත් නිවාස දෙපාර්තමේන්තුවේ සහන නිවාස වැඩසටහන යටතේ යෝජිත ප්‍රතිලාභීන් සඳහා 2013, 2014 සහ 2016 වර්ෂවලදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ණය මුදල් ලබා නොදීම හේතුවෙන් වර්ෂ අවසානයෙහි පිළිවෙලින් රු.5,975,920 ක්, රු.1,290,828 ක් හා රු.3,755,136 ක් වශයෙන් එකතුව රු.11,021,884 ක් බැංකුව විසින් රඳවාගෙන තිබුණි. බැංකුව රඳවා ගත් මෙම මුදල් වෙනුවෙන් කිසිදු පොලියක් දෙපාර්තමේන්තුවට ලැබී නොතිබුණි.

6.8 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් රු.1,200,000 කට මිලදී ගෙන 2014 ජනවාරි 8 දින නාවලපිටිය දිස්ත්‍රික් රෝහල වෙත භාරදී තිබුණු බ්ලඩ් ගෑස් ඇනලයිසර් යන්ත්‍රය ක්‍රියා විරහිතව තිබීම නිසා 2016 දෙසැම්බර් 31 දින වන විට වසර 3 කට ආසන්න කාලයක් භාවිතයෙන් තොරව පැවතුණි.

(ආ) අකුරණ රෝහලට 2015 නොවැම්බර් මාසයේදී ලබාදී තිබුණු රු.642,000 ක් වටිනා Defibrillator නැමති උපකරණය භාවිතයට අදාළ ප්‍රමාණවත් රෝගීන් සංඛ්‍යාවක් නොසිටීම නිසා ඌන උපයෝජිතව පැවතුණි.

(ඇ) රෝහල්වල අවශ්‍යතාවයන් හඳුනා නොගෙන 2016 මාර්තු මස මිලදීගෙන තිබූ රු.21,926,650 ක් වටිනා වර්ග 36 කට අයත් ශල්‍ය වෛද්‍ය උපකරණ 2017 පෙබරවාරි 28 දින වන විටත් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන රෝහල් ගබඩාවල සහ වාට්ටුවල තබා තිබුණි.

(ඈ) දෙවන සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ එකක් රු.6,000 බැගින් රු.1,524,000 ක් ගෙවා 2014 වර්ෂයේ මිලදී ගෙන තිබූ රුධිර පීඩන මාපක 254 ක මිනුම් නිවැරදිව පෙන්නුම් නොකිරීම නිසා ඒවා නැවත ගබඩාව වෙත ගෙන්වා ගෙන තිබුණි.

(ඉ) දෙවන සෞඛ්‍ය වැඩසටහන යටතේ එකකට රු.1,990,000 බැගින් ගෙවා 2015 අවසන් කාර්තුවේ මිලදී ගත් Defibrillator monitor 20 ක් රෝහල් වෙත බෙදාහැර තිබුණු නමුත් එයින් රෝහල් 7 ක පළපුරුදු නිලධාරීන් නොමැති වීම හා හදිසි ප්‍රතිකාර ඒකක ස්ථාපනය කර නොතිබීම ආදි කරුණු නිසා එකී උපකරණ භාවිතයෙන් තොරව ගබඩාවල සහ වාට්ටුවල නිෂ්කාර්යව තබා තිබුණි.

(ඊ) 2008 වර්ෂයේ පුස්තකාල සේවා මණ්ඩල ගොඩනැගිල්ල ඉදිකිරීමේදී සවිකරන ලද රු.1,700,000 ක පිරිවැයකින් යුතු ඩීසල් ජෙනරේටරය හා ජල මෝටරය සවිකල දින සිට ක්‍රියාවිරහිතව වර්ෂ 9 කට ආසන්න කාලයක් ගතව තිබුණි.

(උ) පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ වර්ග අඩි 3755 ක වපසරියකින් යුත් මහල් දෙක වර්ෂයකට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පවතින අතර බිම් මහලේ සවිකර තිබුණු රු.170,000 කට ආසන්න වටිනාකමක් ඇති වායුසමීකරණ යන්ත්‍ර 2 ක්ද අක්‍රියව පැවතුණි. මෙම මහල් දෙක අළුත්වැඩියාව සඳහා 2016 වර්ෂය තුල රු.1,158,119 ක වියදමක්ද දරා තිබුණි.

(ඌ) රජයේ සේවකයන්ට නිල නිවාස ලබා දීම වෙනුවෙන් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් රු. 18,318,444 ක වියදමින් ඉදිකල ගොඩනැගිල්ල සභා ලේකම් වෙත පැවරීමෙන් අනතුරුව මන්ත්‍රීවරුන් සඳහා සංචාරක නිවාසයක් බවට පත්කර තිබුණි. ඊට ගෘහ භාණ්ඩ හා තිර රෙදි සැපයීම සඳහා රු. 2,640,165 ක මුදලක් වැය කර තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2017 ජූනි දක්වා දින 1277 ක කාලය තුල නවාතැන් පහසුකම් සඳහා දින 101 ක් පමණක් භාවිතා කර තිබුණි.

(එ) පැරණි සභා ලේකම් කාර්යාලයේ වර්ග අඩි 2048 ක් වන සභා ගර්භය හා ලී බඩු ඇතුළු උපකරණ, වසර 4 ක කාලයක සිට ද, 2011 වර්ෂයේ දී රු. 39,881,670 වියදමින් ඉදිකල

කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේ එකතුව වර්ග අඩි 2358.5 ක් වූ කාමර 14 ක් වසර 2 ක කාලයක සිට ද නිෂ්කාර්යව පැවතුණි.

(ඒ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පැවති වාහන 53 න් වාහන 38 ක් සඳහා වර්ෂ ගණනාවක සිට රියදුරු පුරප්පාඩු පවතින අතර ඉන් වාහන 25 ක් වෙනුවෙන් තාවකාලිකව ආදේශක රියදුරන් යොදවාගෙන තිබුණි. මේ අනුව වාහන 13 ක් රියදුරන් නොමැතිකමින් ඌන උපයෝජිතව පැවතුණි.

(ඔ) මධ්‍යම පළාත් වෙළඳ, වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තුව විසින් රු.1,190,406 ක වියදමක් දරා හුළඟගහ දියඇල්ල පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම හා නැරඹුම් මැදිරිය ඉදිකිරීම සිදුකර වසර 5 ක් ඉක්මවා තිබුණද කිසිදු ඵලදායී කාර්යයක හෝ ආදායම් උත්පාදක කාර්යයක යොදවා නොගෙන පිවිසුම් මාර්ගයද ඉබි යතුරුදමා වසා දමා තිබුණි. ඒ අනුව දැරූ වියදම නිශ්කාර්ය වී තිබුණි.

6.9 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන අමාත්‍යාංශය යටතේ මුල් ළමාවිය සංවර්ධන ඒකකයක් පිහිටුවා තිබියදී කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය වෙතින් පුහුණු වැඩසටහන් ඉටුකරවා ගැනීම හේතුවෙන් රු.695,110 ක අමතර පරිපාලන හා අධීක්ෂණ වියදමක් දැරීමට සිදුවී තිබුණි.

(ආ) 29 දෙනෙකුගෙන් සැදුම්ලත් කණ්ඩායමක් විදේශගත කිරීම සඳහා ගුවන් ටිකට්පත් මිලට ගෙන තිබියදී අදාළ ගමන අත්හිටුවීම නිසා මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් ගෙවන ලද රු.3,159,550 ක මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.

(ඇ) රුසියානු විදේශ සංචාරයකට නම්කර තිබූ පළාත් සභා මන්ත්‍රීවරයකු එම ගමනට සහභාගි නොවීම හේතුවෙන් ඒ වෙනුවෙන් වැයකර තිබූ රු. 336,550 (ගුවන් ටිකට් පත් ගාස්තු හා ground tour cost) ක මුදල අනාර්ථික වි තිබුණි.

(ඇ) ඉදිකිරීම් හා එහි සැලසුම්වල අඩුපාඩු හේතුවෙන් සංචාරක දෙපාර්තමේන්තුව විසින් 2014 හා 2015 වර්ෂයන්හිදී රු.2,442,842 ක වියදමින් ඉදිකරන ලද නාලන්ද ගෙඩිගේ රථගාල හා සංචාරක පහසුකම් මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

6.10 හඳුනා ගන්නා ලද පාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනතුරට පත්වූ වාහන 116 ක අලාභය වූ රු.13,756,326 ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි. එයින් අලාභය රු.6,563,500 ක් වූ වාහන 34 ක් අනතුරට පත්වී වසර 5 කට වැඩි කාලයක් ගතවී තිබුණි.

(ආ) ප්‍රධාන අමාත්‍යාංශයේ 2013 සිට 2016 දක්වා වූ වසර 4 ක කාලයක් තුළ සිදුවූ වාහන අනතුරු 9 ක් හේතුවෙන් පැනනැගි රු.6,378,323 ක අලාභයෙන්

රු.4,279,296 ක් පමණක් රක්ෂණයෙන් ආවරණය වී තිබුණු අතර, අනතුරු සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 54.6 ප්‍රකාර අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අයකර ගැනීමට පවතින හානි පාඩුවලින් වටිනාකම රු.7,147,687 ක් වූ සිද්ධි 68 ක් වර්ෂ 5 ට වැඩිවූ අතර වටිනාකම රු.4,008,944 ක් වූ සිද්ධි 19 ක් වර්ෂ 10 ට වැඩිවිය.

(ඈ) මුදල් රෙගුලාසි 104, 105 හා 106 ප්‍රකාර සිදුවූ හානි පාඩු හැකිතාක් කඩිනමින් අයකර ගැනීමේ අවශ්‍යතාවය පැවතියද කලාප අධ්‍යාපන කාර්යාල 15 කට අදාලව වර්ෂ 1 සිට 7 දක්වා කාල ප්‍රමාදයකින් යුතු කිසිදු මූලික පරීක්ෂණයක් හෝ ආරම්භ කර නොමැති හානි පාඩු සිදුවීම් 28 ක් පැවතුණි.

(ඉ) කොළඹ වෛද්‍ය සැපයුම් අංශය විසින් සපයන ලද නමුත් පසුව ඒවා ප්‍රමිතියෙන් තොර බවට දැනුම් දීම නිසා මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් ගබඩාවල තිබූ රු. 3,028,815 ක් වටිනා කල් ඉකුත් නොවූ පෙරස් සල්ෆේට් මිලි ග්‍රෑම් 200 ඖෂධ පෙති 6,730,700 ක් සමාලෝචිත වර්ෂයේදී භාවිතයෙන් ඉවත්කර තිබුණි.

(ඊ) මධ්‍යම පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ කම්පැක්ටර් රථ මිලට ගැනීමේදි ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය නොකිරීම නිසා රු.5,089,215 ක මුදල් රජයට අහිමිවී තිබුණි.

(උ) භාණ්ඩාගාර ලේකම්ගේ 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුකූල නොවී පෞද්ගලික ආයතනයකින් ගුවන් ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීම හේතුවෙන් රු. 1,027,200 ක පාඩුවක් සිදුවී තිබුණි.

6.11 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මධ්‍යම පළාත් ආදායම් දෙපාර්තුමේන්තුව පිහිටි ගොඩනැගිල්ල සහ පිවිසුම් මාර්ගය අලුත්වැඩියාව සඳහා 2016 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුවක් මගින් රු. 2,314,000 ක් ලබාගෙන පිවිසුම් මාර්ගය පමණක් අලුත්වැඩියාකර රු.1,191,785 ක් ඉතිරි කර තිබුණි. නමුත් අත්‍යාවශ්‍ය කොටස ඉටු නොකිරීම නිසා ගොඩනැගිල්ල අනාරක්ෂිත තත්වයට පත්ව තිබුණි.

(ආ) හෙළ බොජුන්හල් 8 ක් සඳහා වෙන්කළ රු.24,000,000 ක මුදලින් රු.17,757,284 ක් වැය කර තිබූ අතර යෝජිත ඉදිකිරීම් 2 ක් මුළුමනින්ම අත්හැර දැමීමෙන් වෙන් කළ ප්‍රතිපාදනයෙන් රු. 6,242,716 ක් ඉතිරි වී තිබුණි.

(ඇ) ගල්පාලම ගොවිපලෙහි ගරාජයක් ඉදිකිරීම වෙනුවෙන් රු.1,034,242 ක් ද ද්විත්ව කළමනාකරණ නිල නිවාස වහලයක් ඉදිකිරීම වෙනුවෙන් රු.1,034,505 ක් ද කම්කරු යුගල නිවාස දෙකක් වෙනුවෙන් රු.1,289,465ක් ද ලෙස කර්මාන්ත 04 ක් සඳහා එකතුව රු.3,358,212 ක කළ වැඩ සහතික කර නොතිබියදී ගෙවීම් කර තිබුණි.

6.12 ප්‍රමාද වූ ව්‍යාපෘති

-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු. මිලියන 128.7 ක් ගෙවා තිබුණු නමුත් 2017 මාර්තු 22 වන විටත් එම උප ව්‍යාපෘතිවල ඉදිකිරීම් ප්‍රගතියක් දක්නට නොතිබුණි.

(ආ) වැඩසටහන් 8 කට අදාලව ඉලක්කගත ව්‍යාපෘති 649 කින් ව්‍යාපෘති 105 ක පමණක් වැඩ අවසන් කර තිබූ අතර ඉතිරි ව්‍යාපෘති 544 කින් රු.220,073,616 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 421 ක් අවිච්ඡේදව අඩු භෞතික ප්‍රගතියකින් ක්‍රියාත්මකව පැවතුණි. රු.48,247,000 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 118 ක් ගිවිසුම්ගත වී හෝ ආරම්භ කර හෝ නොතිබුණි.

(ඇ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) මත ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ රු.955,000 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 3 කින් ව්‍යාපෘති 2 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබූ අතර එක් ව්‍යාපෘතියක් අවලංගු කර තිබුණි.

(ඈ) 2016 වර්ෂයේ පළාත් සභා ප්‍රතිපාදන යටතේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ජල දිගු 3 ක් සඳහා රු. 210,265 ක මුදලක් ජල සම්පත් මණ්ඩලය වෙත ගෙවා තිබුණද 2017 මැයි වන විටද එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) 2015 දෙසැම්බර් මාසයේ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත විද්‍යුත් ආදායම් බලපත්‍ර (ERL) වැඩසටහන, මධ්‍යම පළාත තුල හිඟ ආදායම් නිරවුල් කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක කර තිබුණු නමුත්, 2017 මාර්තු 10 දින වන විටත් හිඟහිටි වාහන බලපත්‍ර ගණන හා අයවිය යුතු ආදායම මෙම වැඩසටහන මගින් නිවැරදිව ලබාගත නොහැකි වී තිබුණි.

6.13 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්

-------------------------------------

මධ්‍යම පළාත් සභාවට 1991 ජූනි 13 දින පවරා තිබුණු සිංගල් ට්‍රී පාර අංක 54,56,58,60 හා 64 දරන නිල නිවාස හා බඹරකැලේ පිහිටි අංක 32 දරන නිල නිවාසවල අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

6.14 කාර්ය මණ්ඩල පරිපාලනය

----------------------------

2016 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

6.14.1 පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන හා ප්‍රඥප්ති මගින් පිහිටවූ ආයතන වල සේවක සංඛ්‍යාව (පාසල් හා සෞඛ්‍ය කාර්ය මණ්ඩල හැර)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1010 | 642 | 371 | 03 |
| තෘතියික මට්ටම | 586 | 763 | 50 | 227 |
| ද්විතියික මට්ටම | 7345 | 4370 | 3008 | 33 |
| ප්‍රාථමික මට්ටම | 5578 | 5734 | 776 | 932 |
| කොන්ත්‍රාත් පදනම මත | 13 | 1 | 12 | - |
| වෙනත් | - | 293 | - | 293 |
| එකතුව | 14532 | 11803 | 4217 | 1488 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 56 ක් විය.

(ආ) පළාත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට අනුමත සංවර්ධන නිලධාරි තනතුරු 76 ක් වුවත් තථ්‍ය සංඛ්‍යාව 46 ක් විය. එම සංඛ්‍යාවෙන්ද නිලධාරීන් 20 දෙනෙකු ආයතන 4 කට අවිධිමත් ලෙස මුදා හැර තිබුණි.

(ඇ) පළාත් නිවාස දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 14 ක් පිරවීමට කටයුතු කර නොතිබුණු අතර, අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ සංවර්ධන නිලධාරියෙකු පළාත් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් අනුයුක්ත කරවාගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පළාත් කර්මාන්ත අමාත්‍යාංශයේ පුරප්පාඩු 48 ක් පැවතුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ ද්විතීය මට්ටමේ පුරප්පාඩු 31ක් පැවතුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත සංවර්ධන හා ව්‍යාපාර ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 10 ක පුරප්පාඩු 27 ක් පැවතුණු අතර අතිරික්ත මුරකරුවන් 21 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණි .

(උ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව පුරප්පාඩු 23 ක් පිරවීමට කටයුතු කර නොතිබුණු අතර, පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර වසර 03 1/2 ක කාලයක් හා ජ්‍යෙෂ්ඨ ක්‍රීඩා නිලධාරි තනතුර වසර 3 කට ආසන්න කාලයක සිට පුරප්පාඩුව පැවතුණි.

(ඍ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පුරප්පාඩු 15 ක් පිරවීමට කටයුතු කර නොතිබුණු අතර විධිමත් අනුමැතියකින් තොරව අනියම් රියදුරකු බඳවාගෙන තිබුණි.

(එ) 2016 දෙසැම්බර් 31 දිනට විවිධ දෙපාර්තමේන්තු හා ආයතනවලින් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත නිලධාරීන් 09 දෙනෙකු අනුයුක්ත කරගෙන තිබුණු බැවින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ගොස් තිබුණි. එමෙන්ම ප්‍රධාන අමාත්‍යාංශයේ නිලධාරීන් දෙදෙනෙකු රාජකාරි සඳහා වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වෙත අනුයුක්ත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 212 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 426 ක් වූ අතර සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරු 10 ක පුරප්පාඩු 14 ක් පැවතුණි. අතිරික්ත සේවකයන් තුළ ඇතුළත් කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයන් වෙනුවෙන් රු.13,654,995 ක වැටුප් ගෙවා තිබුණි.

### 6.14.2 පාසල් කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පතිවරු | 1491 | 1059 | 432 | - |
| නියෝජ්‍ය විදුහල්පතිවරු | 196 | 198 | - | 02 |
| ගුරුභවතුන් | 24818 | 31272 | - | 6454 |
| සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය | 2472 | 1702 | 1,056 | 286 |
| එකතුව | 28977 | 34231 | 1488 | 6742 |

සමාලෝචිත වර්ෂය අවසානයට ගුරුභවතුන් 6454 දෙනෙකුගේ අතිරික්තයක් පැවතියද ගලේවෙල කලාපයට අයත් පාසල් 108 ක විවිධ විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු 157 ක් හා නුවරඑළිය හා කොත්මලේ කලාපයන්හි පාසල්වල ගුරු පුරප්පාඩු 710 ක් පැවතුණි. ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට පටහැනිව වත්තේගම කලාපයේ පාසල්වල වසර 8 ක සේවා කාලයක් ඉක්මවූ ගුරුවරුන් 45 දෙනෙකු සිටින බව නිරීක්ෂණය විය.

### 6.14.3 සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1232 | 922 | 321 | 11 |
| තෘතියික මට්ටම | 384 | 305 | 84 | 05 |
| ද්විතියික මට්ටම | 4581 | 3448 | 1138 | 05 |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රාථමික මට්ටම | 3253 | 2300 | 1442 | 489 |
| වෙනත්(අනියම් තාවකාලික) | - | 252 | - | 252 |
| | -------- | --------- | -------- | ---------- |
| එකතුව | 9450 | 7227 | 2985 | 762 |
| | ====== | ===== | ===== | ====== |

සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු අතර විශේෂඥ වෛද්‍යවරු 37 ක්, වෛද්‍යවරු 266 ක්, හෙද සේවාවේ 355 ක්, පවුල් සෞඛ්‍ය සේවිකා 155 ක් හා සෞඛ්‍ය කාර්ය සහායක තනතුරු 552 ක් පැවතුණි.

6.15 බැංකු සැසඳුම්

---------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අංක 295886 දරන ජංගම ගිණුම සඳහා 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණේ 2016 අගෝස්තු මාසය දක්වා වූ සැසඳුම් ප්‍රකාශ පමණක් වන අතර නිකුත් කර මාස 6 ක් ගතවී ඇති නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ එකතු වටිනාකම රු. 238,808 ක් වූ චෙක්පත් 34 ක් සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති 283 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගනුදෙනුකරුවන් විසින් අවස්ථා 5 කදී සෘජුවම බැංකු ජංගම ගිණුමට බැරකර තිබූ එකතු වටිනාකම රු. 45,535 ක් වූ තැන්පතු හා අවස්ථා 2 කදී බැංකු ගිණුමට හර කර තිබුණු රු. 11,420 ක් වූ ගෙවීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ බැංකු ජංගම ගිණුමට ගනුදෙනුකරුවන් විසින් සෘජුවම බැර කර තිබූ එකතු වටිනාකම රු. 1,259,750 ක් වූ තැන්පතු 2 ක් හා රු. 261,145 ක් වූ හඳුනා නොගත් ගෙවීම් හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

7.1 ක්‍රියාකාරී සැලසුම්

---------------------

පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

7.2 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආණ්ඩුකාර කාර්යාලයට ප්‍රාග්ධන වැය සඳහා ප්‍රතිපාදනය කරන ලද රු.65,200,000 කින් රු.52,975,167 ක් වැයකර තිබුණ ද රු. 2,600,000 ක් සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණි.

(ආ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අය වැය චක්‍රලේඛය ප්‍රකාරව, පිළියෙල කල යුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම දෙපාර්තමේන්තු 04 ක් විසින් 2016 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

7.3 අයවැය ලේඛනමය පාලනය
--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රධාන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු 5 ක් විසින් ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට හිමිකමක් නොමැති සංවර්ධන වැය විෂයයන්වලින් රු.199,540,714 ක වත්කම් මිලදී ගෙන තිබූ බැවින් ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවට මෙම වටිනාකම් ඇතුළත් කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) ප්‍රධාන අමාත්‍යාංශය හා ඊට අදාල දෙපාර්තමේන්තු 2 ක් විසින් 2016 දෙසැම්බර් 31 දිනට ඉටු නොකරන ලද වැඩ හා සේවා වෙනුවෙන් ආරෝපිත වටිනාකම් මත ලියා රඳවාගත් චෙක්පත් 6 කට අදාල රු.15,833,685 ක් හා නිශ්චිත කාර්යයක් ඉටුකර නොතිබි අවස්ථා 2 කදී ගෙවන ලද රු.27,007,643 ක් වශයෙන් එකතුව රු.42,841,328 ක් විසර්ජන ගිණුම්වල වැය විෂයයන් 3 ක් යටතේ සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) පළාත් සභා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවති විශේෂ ව්‍යාපෘති 15 කට අදාලව පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන් කර තිබූ රු. 7,436,978,924 ක ප්‍රතිපාදනවලින් රු. 6,614,084,487 ක් ඉතිරිවී තිබුණි.

7.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම
----------------------------------

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂයන්හි මධ්‍යම පළාත් සභාවේ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කල දිනය | සභාගත කල දිනය |
|---|---|---|
| 2011 | 2013.03.28 | 2015.09.08 |
| 2012 | 2014.07.04 | 2016.02.16 |
| 2013 | 2015.01.07 | 2015.05.05 |
| 2014 | 2015.10.08 | 2015.11.03 |
| 2015 | 2016.11.16 | 2017.07.18 |

7.5 නොවිසඳී ඇති විගණන ඡේද
--------------------------------

ඉකුත් වර්ෂ වලට අදාළ විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද පළාත් රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් පරික්ෂා කිරීමෙන් අනතුරුව ආයතන 10 ක පසුවිපරම් කටයුතු නිම නොවූ ඡේද 134 ක් විය.

7.6 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම
----------------------------------------

පළාත් සභාවේ මූලික අරමුණුවලට අනුකූල නොවන අයුරින් රාජ්‍ය බැංකු දෙකක එකතුව රු.1,362,627,575 ක ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණි.

08. පද්ධති හා පාලනය
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පළාත් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධතිය | පද්ධතියේ අඩුපාඩුව |
| --- | --- |
| (අ) ආදායම් පාලනය | (i). ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම<br>(ii). ආදායම් හා හිඟ ආදායම් අයකර නොගැනීම<br>(iii). ආදායම් උත්පාදක ව්‍යාපෘති පිළිබඳ පසුවිපරම් නොකිරීම |
| (ආ) වත්කම් කළමනාකරණය | (i). ස්ථාවර වත්කම් ඌන උපයෝජනය<br>(ii). වාර්ෂිකව වත්කම් සමීක්ෂණය නොකිරීම |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | කාර්ය මණ්ඩල අතිරික්ත හා පුරප්පාඩු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබීම |
| (ඈ) කොන්ත්‍රාත් පරිපාලනය | (i). අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම<br>(ii). ක්‍රියාත්මක කොන්ත්‍රාත්වල ප්‍රගතිය පරික්ෂා නොකිරීම |